www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මුම්බායිහි ත්‍රස්තවාදී කෲරත්වය

## Terrorist atrocity in Mumbai

**කර්තෘ මන්ඩලය විසිනි**
**2006 ජුලි 12**

ඉන්දියාවේ ජනාකීර්න ම නගරය සහ මූල්‍ය මධ්‍යස්ථානය වන මුම්බායිහි ඊයේ සිදු කරන ලද ඒකාබද්ධ බෝම්බ ප්‍රහාරය ලෝක සමාජවාදී වෙබ් අඩවිය හෙලා දකී. මිනිසුන් කඩිනමින් නිවෙස් බලා යමින් සිටි අඟහරුවාදා සන්ධ්‍යාවේ බටහිර දුම්රිය මාර්ගයේ ධාවනය වෙමින් තිබූ මගී දුම්රිය හතක් තුල හෝ ඒ ආසන්නයේ එකකට පසු එකක් ලෙසින් ක්ෂනිකව පුපුරා ගිය බෝම්බ අටෙන් අවම වශයෙන් 179ක් මිය ගිය අතර 400ක් තුවාල ලැබූහ.

උපරිම ජීවිත ගනනක් විනාශ කිරීමේ අරමුනෙන් මෙම බෝම්බ කාලය සහ ස්ථානය පිලිබඳව ගනන් බලා අටවා ඇති බව පැහැදිලි ය. මගීන්ගෙන් පිරී ඉතිරී තිබුනු දුම්රිය මැදිරි කැබැලි කරමින් ලේ සහ සිරුරු කොටස් සෑම දිශාවට ම විහිදුවමින් බෝම්බ පුපුරා ගියේ ය. සිදධිය පිලිබඳව පරීක්ෂන පවත්වන පොලිස් නිලධාරීන් කියා සිටියේ හිස්වල සහ පපු ප්‍රදේශවල සිදුව ඇති අති මහත් තුවාල සංඛ්‍යාව අනුව, මැදිරිවල හිසට ඉහලින් ඇති රාක්කවල මෙම බෝම්බ රඳවා තිබී ඇති බවට අනුමාන කල හැකි බව යි. දිවි බේරා ගැනීමේ සහන සේවා උත්සාහයන් මෙතෙකුදු සිදු වන තතු යටතේ සහ තුවාලකරුවන්ගෙන් බොහොමයක් අසාධ්‍යව සිටින තතු යටතේ මරන සංඛ්‍යාව තවත් ඉහල යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

බෝම්බ පුපුරා යන මොහොතේ පැවැති මහ වැසි, හැකි ඉක්මනින් තම නිවෙස් කරා යාමට යුහුසුලුවන භීතියෙන් සලිත වූ මගීන්ගෙන් පිරී ඉතිරී අවහිර වූ වීදි සහ අක්‍රිය වූ දුරකථන ජාලයන් විසින් තත්වය තවත් අවුල් කරමින් සහන සේවා අඩාල කෙරින.

*නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පත මෙසේ වාර්තා කලේ ය: " සිද්ධියෙන් පසුව තැලී පොඩිවී ගිය දුම්රිය සුන්බුන්, ඉරී ගිය සිරුරු කොටස්, බියපත් හා තුවාල ලැබූ මගීන් හා ඉන් සමහරකගේ ලෙයින් නැහැවුනු මුහුනුවල දසුන් ජාතිය හරහා රූපවාහිනියෙන් විකාශය කෙරින."

බෝම්බකරුවන්ගේ අරමුන කුමක් වුව ද හිතාමතා සිදු කරන ලද මෙම හිතුවක්කාරී මිනිස් ඝාතනය බියකරු අපරාධයක් වන අතර එමගින් සිදුවන එකම දෙය නම් ඉන්දියාව හා ලොවපුරා දේශපාලන ප්‍රතිගාමිත්වයට ආධාර කිරීමයි.

බලාපොරොත්තු වියහැකි පරිදි ම බුෂ් පරිපාලනය විසින් මුම්බායිහි සිදුවීම් තම "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය"- එනම් මිලිටරි ආක්‍රමනයන් මගින් තෙල්වලින් ආඪ්‍ය මධ්‍යම ආසියාවේ සහ මැද පෙරදිග කලාපයන්හි තම මූලෝපායික ආධිපත්‍යය තහවුරු කිරීමට සහ රට තුල ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කෙරෙන ප්‍රහාරයන් තීව්‍ර කිරීමට යොදා ගැනෙන කඩතුරාව - ප්‍රවර්ධනය කිරීම සඳහා ඩැහැ ගත්තේ ය. "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ දී අපි සියලු දෙනා ඉන්දියාව සමග සිටින්නෙමු" යි රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස් ප්‍රකාශ කලාය.

ඉන්දියාවේ නගර සියල්ල ම ඉහල සෝදිසියෙන් තබන ලෙස ඉන්දියානු ආන්ඩුව ආරක්ෂක බලකායන්ට අන කලේ ය. අගමැති මන්මෝහන් සිං පුවත්පත් නිවේදනයක් නිකුත් කරමින් රාජ්‍ය අධිකාරයන්ට දැඩිව කියා සිටියේ "ත්‍රස්තවාදීන්ගේ දුෂ්ඨ සැලැසුම් පරාජය කිරීම සඳහා වැඩ කල යුතු අතර එම කටයුතු ඉදිරියට ගෙන යාමට ඉඩ නොදිය යුතුයි" යනුවෙනි.

බදාදා උදෑසන වන තෙක් (ඉන්දියානු වේලාවෙන්) බෝම්බ ප්‍රහාරයේ වගකීම කවර හෝ කන්ඩායමක් විසින් භාරගනු නොලැබින. නමුත් ඉන්දියානු මාධ්‍යයන් විසින් වාර්තා කරනු ලැබුවේ බෝම්බ ප්‍රහාරය "පැහැදිලිව ම" ලෂ්කාර්-ඊ-ටයිබා (ශුද්ධත්වයේ හමුදාව) හි වැඩක් බැව් ආන්ඩුවේ ඉහල මට්ටමේ නිර්නාමික මූලාශ්‍රයක් පැවසූ බවයි. බහුතරයක් මුස්ලිම් ජනයා වෙසෙන ජම්මු ප්‍රාන්තය ඉන්දියානු සංගමයේ කොටසක්ව පැවතීමට මෙම ත්‍රස්තවාදී සංවිධානය විරුද්ධ ය. මූලාශ්‍රයන්ට අනුව බෝම්බ ප්‍රහාරයේ අරමුන වී ඇත්තේ ඉන්දියාව තුල වාර්ගික ප්‍රකෝපකරනයක් ඇති කොට එමගින් මුස්ලිම් සුලුතරයට එරෙහිව හින්දු ප්‍රති ප්‍රහාරයක් අවුලුවා කාශ්මීරය තුල ඉන්දියානු විරෝධී නැගිටීමක් සඳහා වාසි අත් කර ගැනීම සහ ඉන්දියාව සහ පකිස්ථානය අතර සාම සාකච්ඡාවලට වල කැපීමයි.

කාශ්මීරයේ ඉන්දියානු පාලනයට එරෙහි ලෂ්කාර්-ඊ-ටයිබා සහ අනෙකුත් ඉස්ලාම්වාදී ත්‍රස්ත සංවිධාන විසින් සිවිල් වැසියනට එරෙහිව නැවත නැවතත් ප්‍රහාර එල්ල කරමින් වාර්ගිකවාදී දාමරික ක්‍රියා මාලාවක් සිදු කොට ඇත.

අඟහරුවාදා උදෑසන ජම්මු සහ කාශ්මීරයේ ගිම්හාන අග නගරය වන ශ්‍රී නගර්හි දී සංචාරකයින් එල්ල කොට සිදු කරන ලද ග්‍රෙනේඩ් ප්‍රහාර තුනකින් අට දෙනෙකු මිය ගිය අතර 35 කට වැඩි ගනනක් තුවාල ලැබූහ.

නමුත් මෙම බෝම්බ ප්‍රහාරයේ නිර්මාතෘ ලෂ්කාර්-ඊ-ටයිබා (එල්ඊටී) වූයේ නම් එය නව මට්ටමේ තාක්ෂනික දියුනුවක් නියෝජනය කල යුතු ය.

එල්ඊටීඊ ප්‍රකාශකයකු විසින් ශ්‍රී නගර් හෝ මුම්බායි හි ත්‍රස්ත ප්‍රහාරයත්ට තම සංවිධානයේ කවර හෝ සබඳතාවක් නැතැයි පැවසී ය. හින්දු පුවත්පතට අනුව එල්ඊටී නියෝජිත ආචාර්ය අබ්දුල්ලා ශ්‍රී නගර්හි මාධ්‍ය සංවිධාන කීපයකට ම දුරකථනයෙන් කතා කරමින් ප්‍රහාරයන් "අමානුෂික හා ම්ලේච්ඡ" ක්‍රියාවන් ලෙස හෙලා දැක ඇත. "එවන් අමානුෂික ක්‍රියාවක් සම්බන්ධයෙන් එල්ඊටීයට චෝදනා කිරීම වනාහි ජම්මු සහ කාශ්මීර නිදහස් අරගලය අපකීර්තියට පත් කිරීම සඳහා ඉන්දියානු ආරක්ෂක ඒජන්සි විසින් ගනු ලැබූ උත්සාහයකි" යි ඔහු තව දුරටත් පැවැසී ය.

ත්‍රස්තවාදී ක්‍රියාවන්හි සහජ ස්වභාවය අනුව ත්‍රස්තවාදී කුමන්ත්‍රනයන් අවසන් වන්නේ කොතැනින් ද රහස් ඒජන්සිවල, ආරක්ෂක හටකායන්හි සහ දක්ෂිනාංශික ප්‍රකෝපකාරීන්ගේ වැඩ කටයුතු ඇරඹෙන්නේ කොතැනින් ද යන්න නිර්නය කල නොහැක.

දරුනු මර්දනය මගින් කාශ්මීරයේ කැරලිකාරිත්වය ද රටෙහි අනෙක් කොටස්වල උද්සෝෂනයන් ද මැඩලීමට ඉන්දියානු ආරක්ෂක හමුදාවන් මාන බලයි. වධ දීම්, මිනී මැරුම්, කඩා පැනීම් සහ ප්‍රකෝපකරනයන්, සහ ජන සමූහයන් රඳවා තබා ගැනීම් හරහා "ත්‍රස්තවාදීන්" සෙවීම එල්ල කොට කෙරෙන උද්සෝෂන දෛනික ජීවිතයේ සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇත.

මුම්බායිහි ඊයේ සිදු කෙරුනු දාමරික ක්‍රියාව, සන්ත්‍රාසයට පත් කිරීම මගින් රාජ්‍ය මර්දනයන් තීව්‍ර කිරීම පිලිගන්නා තත්වයට මහ ජනතාවගේ විඥ්ඥානය සැකැසීමේ අරමුනෙන්, ඉන්දියාවේ රහස් ඒජන්සියකට සේවය කරන ප්‍රකෝපකාරී ඒජන්ත කල්ලියකගේ පහසුකම් සැපැයීමෙන් හෝ සංවිධානයෙන් සිදු කෙරුනක්ද එසේ නොමැති නම් ආරක්ෂක හමුදාවන් තුල සිටින එවන් කොටස් එය සිදු වීමට ඉඩ හැරියේ යැයි ද යන්න නොතකා සිටිය නොහැක. එමෙන්ම මෙය මුස්ලිම් විරෝධී ප්‍රචන්ඩත්වයන් අවුලුවාලීමේ අරමුනෙන් හින්දු ආධිපත්‍යවාදී උන්මත්තකයින් විසින් සිදු කලා ද විය හැක.

ඉන්දියානු ස්වදේශ ඇමැති ෂිව්රාජ් පටිල් කියා සිටියේ ප්‍රහාරයන් එන බවට අධිකාරයන් වෙත අනතුරු ඇඟැවීම් ලැබී තිබුන ද "ස්ථානය හා වේලාව නොදැන සිටි" බවයි.

2001 දෙසැම්බරයේ දී ඉන්දියානු පාර්ලිමේන්තුවට ප්‍රහාරයක් එල්ල වූ මොහොතේ එයට එල්ඊටී ය වග කිව යුතුයැයි චෝදනා කරමින් එවකට පැවැති භාරතීය ජනතා පක්ෂ (බීජේපී) නායකත්වයෙන් යුත් ඉන්දීය ආන්ඩුව රුදුරු "ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත" සම්මත කර ගැනීමටත් එල්ඊටීයට ආධාර කරන්නේ යැයි චෝදනා කරමින් තම දිගු කාලීන එදිරිවාදියා වන පකිස්ථානයට එරෙහිව යුද තර්ජන එල්ල කිරීමටත් අවස්ථාව ඩැහැ ගත්තේ ය. පකිස්ථානය කෙරෙන් ප්‍රධාන සහනයන් ලබා ගැනීම සඳහා පීඩනය යොදනු වස් ඉන්දියානු ආන්ඩුව දසලක්ෂයක භට හමුදාවක් සටන් සඳහා සූදානමින් වර්ෂයකට ඉතා ආසන්න කාලයක් පකිස්ථාන දේශ සීමාව අසල රඳවා තැබී ය.

2004 මැතිවරනයේ දී බීජේපී නායකත්වයෙන් යුත් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය විස්ථාපනය කරමින් බලයට පැමිනි එක්සත් ප්‍රගතිශීලී සන්ධානය (යූපීඒ) ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ඉවත් කල නමුදු එමගින් අධිකරනයට හඳුන්වා දී ස්ථාපිත කෙරුනු ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිපාදන බොහොමයක් ම මෙතෙකුදු එසේ ම ක්‍රියාත්මක වේ.

2001 දෙසැම්බරයේ දී බීජේපී ආන්ඩුව දැක්වූ ප්‍රතිචාරයට විපරීතව කොන්ග්‍රස් පක්ෂ නායකත්වයෙන් යුත් යූපීඒ ආන්ඩුව, අවම වශයෙන් මේ දක්වා, මුම්බායි හෝ ශ්‍රී නගර් ප්‍රහාරවලින් කවරකට හෝ පකිස්ථානය සම්බන්ධ බවට චෝදනා නගා නොමැත. ඉස්ලාමාබාදය පැත්තෙන් ගත් කල මුම්බායි ප්‍රහාරය සිදුවූ සැනින් එය හෙලා දැකීය.

ඊයේ සිදු කරන ලද ත්‍රස්තවාදී දාමරික ක්‍රියාවට මුම්බායිහි මහ නගර සභා ආන්ඩුව පාලනය කරන සහ මහාරාෂ්ට්‍ර ප්‍රාන්තය තුල නිල විපාර්ශ්වය හැඩ ගන්වන බීජේපීයේ සහකරුවා සහ හින්දු ආධිපත්‍යවාදී සගයා වන ශිව් සේනා සංවිධානය ප්‍රතිචාර දැක්වූයේ තම පුර වැසියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට අසමත්වීම හේතුවෙන් ප්‍රාන්ත රාජ්‍යය පාලනය කරන ජාතිකවාදී කොන්ග්‍රස් පක්ෂ ආන්ඩුව ඉල්ලා අස් විය යුතුයැයි බල කිරීමෙනි.

පකිස්ථානය සමග යහපත් සබඳතා වර්ධනය කර ගැනීමට කොන්ග්‍රසය දරන උත්සාහය මත බෝම්බ ප්‍රහාරයේ වරද පැටවීමට ශිව්සේනා නායක බාල් තැකරේ උත්සාහ කලේ ය. "පකිස්ථානයට බස්

සේවාවන් මෙහෙයවීම සඳහා මධ්‍යස්ථානය යුහුසුලු වන අතර ඉස්ලාමාබාදය, තම පාර්ශ්වයෙන්, ඉනදියාවට ත්‍රස්තවාදීන් තල්ලු කිරීම සඳහා යුහුසුලුය." යනුවෙන් තැකරේ *ටයිම්ස් ඔෆ් ඉන්ඩියා* පුවත් පතට ප්‍රකාශ කලේ ය. "ජනතාවගේ ඉවසීම ඉතාමත් පටු වී ඇතැයි කොන්ග්‍රසයට අනතුරු ඇඟවීමට මම බලා පොරොත්තු වෙමි. තෘස්තවාදීන් සමග හරි හැටි ගනු දෙනු නොකලහොත් මධ්‍යස්ථානයෙහි පමනක් නොව ප්‍රාන්තයන්වල ද කොන්ග්‍රස් ආන්ඩුවට එරෙහිව අතෘප්තියේ පුපුරා යාමක් සිදු විය හැක."

කොන්ග්‍රසය මගින් නායකත්වය දෙනු ලබන යූපීඒ ආන්ඩුව ත්‍රස්තවාදය සම්බන්ධයෙන් "මෘදු" යැයි මාස ගනනාවක් තිස්සේ චෝදනා කරමින් සිටින බීජේපීය ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත සමස්තයක් ලෙස යලි ස්ථාපිත කිරීමට උද්ඝෝෂනය කරයි.

© www.wsws.org